**මාෂ භෝග සහ ධාන්‍ය පර්යේෂණ හා නිෂ්පාදන අධිකාරිය**
---------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2002 සිට 2010 වර්ෂය දක්වා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2. විගණන නිරීක්ෂණ

### 2.1 ක්‍රියාකාරිත්වය

2001 වර්ෂයෙන් පසු අධිකාරියේ කටයුතු අක්‍රීය වී තිබුණු අතර ඊට අදාලව කාර්ය මණ්ඩලයක් හා පාලන මණ්ඩලයක්ද නොවීය. තවද, අධිකාරියේ කටයුතු ක්‍රියාත්මක කරීමට හෝ ඈවර කිරීමට හෝ අමාත්‍යාංශය කටයුතු කළ බවට සාක්ෂි නොවූ අතර, අධිකාරිය පිහිටුවීමට අදාල අණපනත්ද විගණනයට ඉදිරිපත් නොවීය.

### 2.2 ගිණුම්, පොත්පත් හා ලේඛන පැවැත්වීම

සමාලෝචිත වර්ෂයට අදාල ගිණුම්, පොත්පත් හා ලේඛන පැවැත්වූ බවට කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවීය.

## 2.3 වත්කම්වල හා වගකීම්වල පැවැත්ම

අධිකාරිය විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2001 දෙසැම්බර් 31 දිනට වූ ශේෂ පත්‍රයේ දැක්වෙන පහත සඳහන් වත්කම් හා බැරකම් සම්බන්ධ කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවායේ පැවැත්ම හා නිවැරදිතාවය පිළිබඳ සතොසක්ෂණය කළ නොහැකි විය.

| වත්කම් | රු. | බැරකම් | රු. |
|---|---|---|---|
| කාර්යාල උපකරණ | 357,803 | සී/ස ජනතා පොහොර ව්‍යවසාය | 317,537 |
| ස්ථාවර තැන්පතු | 4,200,000 | ගෙවිය යුතු විගණන ගාස්තු | 22,374 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී | 590,301 | ගෙවිය යුතු බැංකු පොලී සඳහා බදු | 59,030 |
| හිස් පොහොර මලු ඉතිරි තොගය | 347,555 | උපචිත වියදම් | 80,000 |
| බැංකු ඉතිරිය | 63,676 | | |

## 2.4 අරමුදල් ආයෝජනය

රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පත් ගිණුමක රු.4,200,000 ක මුදලක් අධිකාරිය විසින් ආයෝජනය කර තිබූ අතර එහි වාර්ෂික පොලිය අධිකාරියේ ජංගම ගිණුමකට බැර වෙමින් පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එම ගිණුමේ පැවති රු.4,581,726 ක ශේෂය ඵලදායි ආයෝජනයක යෙදවීමට කටයුතු කර නොතිබුණි.